# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,301 - 2022 ඔක්තෝබර් මස 07 වැනි සිකුරාදා - 2022.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 218 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 218 |


*සැ. යු.* - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත, 2022 සැප්තැම්බර් මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ඔක්තෝබර් මස 28 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ඔක්තෝබර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.08.08 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/3261 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මාගස්තොට, ගැමුණුපුර පදිංචි සුහසිංහ පතිරණගේ සෝමාවතී වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/18/410/87 අංකය යටතේ 1987.05.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.11.04** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔය පළාත, පත්තුවේ/කෝරළේ 535 ඒ මාගස්තොට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මහගස්තොට නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, නුවරඑළිය සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පි. පි. නු. 1012 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 67 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.088 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : පි. පි. නු. 1012 හි කැබලි අංක 65,
*නැගෙනහිරට* : පි. පි. නු. 1012 හි කැබලි අංක 68,
*දකුණට* : පි. පි. නු. 1012 හි ගැමුණුපුර, මුඩුබිම,
*බස්නාහිරට* : පි. පි. නු. 1012 හි කැබලි අංක 44.

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2020 මාර්තු මස 12 වැනි දින.

10-57

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/68872.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NP/28/04/2/SLO/41/1803.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

යාපනය දිස්ත්‍රික්කයේ, වේලනෙයි (දිවයින දකුණ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේලනෙයි ඊසාන (J/13) ග්‍රාම නිලධාරී වසමේ අරාලිතුරයි ගමේ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද දළ අනුරේඛනයේ කොටසින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 09 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු (කකුළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතියක්) සඳහා Ocean Aqua Farm විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : රජයේ ඉඩම,
*නැගෙනහිරට* : මුහුද, වෙරළ රක්ෂිතය,
*දකුණට* : වෙරළ රක්ෂිතය,
*බටහිරට* : රජයේ ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ) බදු කාලය* .- අවුරුදු තිහයි (30) ( 2022.06.30 දින සිට ඉදිරියට වසර තිහක්).

*(ආ) වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු (කකුළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතියක්) සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2022.06.30 වැනි දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*(ඒ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. වී. ටී. ඩී. අමරසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2022 සැප්තැම්බර් මස 22 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 103

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2022.10.07 | සිකුරාදා | 2022.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.14 | සිකුරාදා | 2022.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.21 | සිකුරාදා | 2022.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.28 | සිකුරාදා | 2022.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2022.11.04 | සිකුරාදා | 2022.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.11 | සිකුරාදා | 2022.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.18 | සිකුරාදා | 2022.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.25 | සිකුරාදා | 2022.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2022.12.02 | සිකුරාදා | 2022.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.09 | සිකුරාදා | 2022.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.16 | සිකුරාදා | 2022.12.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.23 | සිකුරාදා | 2022.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.30 | සිකුරාදා | 2022.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.